## මිළ

1984 වර්ෂයේ සිල්ලර මිළ හැසිරීමෙහි ප්‍රධාන ලක්ෂණය වූයේ වර්ෂයේ මුල් භාගයෙහි සිදු වූ තියුණු මිළ වැඩිවීම සහ දෙවන භාගයෙහි සිදු වූ සැළකිය යුතු මිළ අඩු වීමයි. වර්ෂයේ අග භාගයේදී මිළ අඩුවීම 1983 වර්ෂයේ සම කාලය තුළදී දක්නට ලැබුණු මිළ හැසිරීම හා සැසඳීමේදී පැහැදිලි ප්‍රතිවිරුද්ධතාවයක් පෙන්නුම් කරයි. කොළඹ පාරිභෝගිකයින්ගේ මිළ දර්ශකයේ වාර්ෂික සාමාන්‍යය සියයට 17 ක වැඩි වීමක් වාර්තා කළ නමුත්, 1983 වර්ෂයේ සියයට 14 හා සැසඳීමේදී 1984 දෙසැම්බර් දර්ශකය පසුගිය වර්ෂයේ දෙසැම්බර් දර්ශකයට වඩා වැඩි වූයේ සියයට 9 කින් පමණි. 1983 වර්ෂයේ සියයට 21 හා සැසඳීමේදී මෙය මඳ වැඩි වීමකි. මේ අයුරින්ම, තොග අලෙවි මිළ දර්ශකය පසුගිය වර්ෂයේ සියයට 25 කින් වැඩි වී 1984 දී සියයට 26 කින් වැඩි වූ නමුත් 1983 දෙසැම්බර් හා සැසඳීමේදී 1984 දෙසැම්බර් දර්ශකය වැඩි වූයේ සියයට 5 ක් පමණි.

කොළඹ පාරිභෝගිකයින්ගේ මිළ දර්ශකයේ වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආහාර උපදර්ශකයෙහි වූ සියයට 18.1 ක ඉහළ නැගීමයි. (බර සියයට 61.9) පසුගිය වර්ෂයේ ඉන්ධන හා ආලෝකය, රෙදිපිළි සහ විවිධ යන උපදර්ශකයන් පිළිවෙලින් සියයට 33.2, 6.3 සහ 15.0 යන ප්‍රමාණයන්ගෙන් ඉහළ ගිය අතර මෙම වර්ෂයේදී එම ඉහළ යෑම් පිළිවෙලින් සියයට 17.9, 5.6 සහ 14.6 ක් විය.

අවාසිදායී කාලගුණික තත්ත්වයන්, විධායකය මගින් කළ මිළ ප්‍රතිශෝධන සහ දේශීය වෙළෙඳපොල කෙරෙහි වූ අධික අපනයන මිළෙහි බලපෑම 1984 වර්ෂයේ මුල් භාගය තුළ සිදු වූ ආහාර මිළෙහි තියුණු ඉහළ යාමට දායක වූ කරුණු විය. ජනවාරි මාසයේදී සහල්, තිරිඟු පිටි සහ පාන් මිළ ප්‍රතිශෝධනය කරන ලදී. වර්ෂයේ මුල් භාගයේ අධික වර්ෂාව නිසා සිදු වූ වගා පාලුව නිසා හාල් සහ එළවළුවලද, මිරිස් සහ රතුළූනු වැනි අතිරේක ආහාරවලද මිළ ඉහළ නැගුණි. 1983 අවසාන භාගයෙහි ඉහළ නැඟුණ පොල් මිළ 1984 පළමු කාර්තුව තුළද, තවදුරටත් ඉහළ නැගුණි. වර්ෂයේ මුල් භාගය තුළ පොල් තෙල් මිළද ඉහළ මට්ටමක පැවතියේය. වර්ෂයේ දෙවන භාගයේ තිබූ විශේෂ ලක්ෂණය වූයේ, පොල්, පොල් තෙල් සහ එළවළු වැනි ප්‍රධාන භාණ්ඩයන්ගේ මිළ පහළයෑමේ ප්‍රවනතාවයයි. දර්ශකයේ මාසික වැඩි වීමේ ප්‍රමාණයේ වේගය පෙබරවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා ක්‍රමයෙන් අඩු වෙමින් අවුත්, 1977 සැප්තැම්බර්වලට පසු පළමුවරට අඩු වීමක් වාර්තා කළේය. වර්ෂයේ අවසාන කාර්තුවේ සිදු වූ වැඩි වීමද සිරිත් පරිදි වර්ෂය අවසානයේ සිදු වන වැඩිවීම්වලට වඩා සාපේක්ෂ වශයෙන් අඩුය.

1984 වර්ෂයේ අපනයන මිළ සියයට 61.9 කින් ඉහළ නැගුණ අතර, 1983 දී එය ඉහළ නැගුනේ සියයට 43.9 කිනි. මෙයට හේතු වූයේ විශේෂයෙන්ම වර්ෂයේ පළමු කාර්තුවේදී පොල් නිෂ්පාදන සහ තේ සඳහා තිබුණු අධික අපනයන මිළයි. 1983 දී දේශීය අයිතමයන්ගේ මිළ සියයට 12.8 කින් වැඩි වූ අතර, මෙම වර්ෂයේ එම වැඩි වීම සියයට 15.7 ක් විය. ආනයන කාණ්ඩයේ මිළ මෙවර සියයට 10.4 කින් වැඩි වූ අතර පසුගිය වර්ෂයේ වැඩි වීම සියයට 9.5 ක් විය.

1984 මුල් කාර්තුවේදී තොග අලෙවි මිළ දර්ශකය එහි ඉහළම මට්ටමේ පැවතුණි. මැයි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා කාලය තුළ දර්ශකයේ අඩු වීමෙහි ප්‍රවනතාවයක් පැහැදිලිව දක්නට ලැබුණි. සැප්තැම්බර් මාසයේදී මිළ ස්ථාවර වුවද, හතර වන කාර්තුවේ මිළ පළමු වන කාර්තුවේ මිළට වඩා අඩු මට්ටමක පැවතුණි.

දර්ශකයේ ඇතැම් අපනයන අයිතමයන් සඳහා සාපේක්ෂකව දී ඇති වැඩි බර තැබුම් නිසා තේ සහ පොල් අපනයන මිළෙහි හැසිරීම 1984 දර්ශකය කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කළේය. අපනයන අංශය සඳහා වූ උපදර්ශකය සියයට 51.2 කින් වර්ධනය වුවත්

